*සැ. යු.*– 2008.01.25 දින පළ කරන ලද අංක 1,534 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,535 - 2008 පෙබරවාරි මස 01 වැනි සිකුරාදා - 2008.02.01**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 96 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 98 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ නරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 පෙබරවාරි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජනවාරි මස 25 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

93 - B 079583 —9,425 (2008/02)
B1 –

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ අසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරිම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරිම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනි එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු – හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාශවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම් කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 මාර්තු මස 01 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජනවාරි මස 10 දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාශය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | බෙලිඅත්ත | කහවත්ත පහල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ දකුණු ගිරුවාපත්තුව කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට. |

02-72

## සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ උපදේශන සහකාර නිළධාරි තනතුරු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම

සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ඇති ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත විස්තර දැක්වෙන පරිදි සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *මෙම තනතුරු සම්බන්ධයෙන් සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා ඡේදවල විධිවිධාන ද අදාළ වේ.
(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධානවලට හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.
(iv) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

2. *වැටුප් පරිමාණය* :– මෙම තනතුරු සඳහා බඳවා ගන්නා උපාධිධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 ( iv) අනුව එම්/එන්/4-2006- A වැටුප් පරිමාණය හිමි වේ.
රු. 15,215-10 x 215-4 x 240-7 x 320-15 x 360-රු. 25,965

3. *මූලික සුදුසුකම්* :

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) 2008/02/29 දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ යෙදී, සිටින අයට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

4. *බඳවා ගැනීමේ ක්‍රමය* :– ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

පහත දක්වා ඇති පරිදි තනතුරු පුරප්පාඩු සඳහා අදාළ උපාධි සහිත අය පමණක් අයදුම් කළ යුතුය.

| *තනතුරු නාමය* | *අධ්‍යාපන සුදුසුකම්* | *පුරප්පාඩු පවතින අංශය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|---|
| 1. උපදේශන සහකාර | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝවිද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සමඟ රජය පිළිගත් ආයතනයකින් උපදේශනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම | උපදේශන අංශය | 32 |

05. *අයදුම්කිරීමේ ක්‍රමය* :– පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර 2008.02.29 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය, 5 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සහිතව අයදුම් කළ යුතුය. (තේරී පත්වුවහොත් මුදාහැරීම සඳහා එකඟවන බව දැන්විය යුතුය.) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ

"උපදේශන සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් සහ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අසම්පූර්ණ ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම නිවේදනයේ ආවරණය නොවන කරුණක් පිළිබඳව සහ බඳවා ගැනීම හෝ ඇබෑර්තු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම හෝ නොකිරීම සම්බන්ධ අවසාන තීරණය සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් සතුය.

වී. ජෙගරාසසිංගම්,
ලේකම්,
සමාජ සේවා හා සමාජ සුභසාධන
අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 01 වැනි දින,
5 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

ආදර්ශ අයදුම් පත්‍රය

**සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ පවත්නා තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම**

| | |
|---|---|
| අයදුම්කරන භාෂා මාධ්‍යය | |
| අයදුම්කරන තනතුරු නාමය | |
| එම තනතුරට අදාළ අංශය | |

1. මුලකුරු සමඟ නම : ............................. පූජ්‍ය/මයා/මිය/මෙය
(Name with initial) Rev./Mr./Ms. :——————.

2. සම්පූර්ණ නම :——————.
Full Name :——————.

3. ස්ථිර ලිපිනය :——————.

4. දැනට පදිංචි ලිපිනය :——————.

5. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.

6. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

8. i) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :———.

ii) 2008.02.29 දිනට වයස : අවුරුදු :———. මාස :———. දින :———.

9. ජාතිය :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. උපාධිය පිළිබඳ විස්තර :————.

(i) විශ්ව විද්‍යාලය :————.
(ii) උපාධිය පිරිනැමූ දිනය :————.
(iii) විශේෂවේදී/සාමාන්‍ය :————.
(iv) විෂයයන් :————.
(v) පන්තිය : පළමු/දෙවන පෙළ ඉහළ/දෙවන පෙළ පහළ :————.
(vi) භාෂා මාධ්‍යය :————.

12. අදාළ වන වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ඒ පිළිබඳ විස්තර :

i. ————.
ii. ————.
iii. ————.

13. භාෂා ප්‍රවීණත්වය (අදාළ තීරුවෙහි (✓) ලකුණ යොදන්න.)

| | *ඉතා හොඳයි* | *හොඳයි* | *සාමාන්‍යයි* | *දුර්වලයි* |
|---|---|---|---|---|
| සිංහල | ......... | ......... | ......... | ......... |
| දෙමළ | ......... | ......... | ......... | ......... |
| ඉංග්‍රීසි | ......... | ......... | ......... | ......... |

14. පළපුරුද්ද :————.

*අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය*

.......................... වන මම මෙහි සඳහන් කරන ලද සියළුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත සේවයෙන් විශ්‍රාම ගන්වා නොමැති බවත් තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරාගැනීමට කලින් හෙලිවුවහොත් නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කිරීමට හැකි බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ....................... මහතා/මහත්මිය/මෙය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ....................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
තනතුර :
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

02-02

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ ඇබෑර්තු සඳහා විවෘත හා සීමිත තරග විභාගය

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පශු පර්යේෂණ නිලධාරි, පශු වෛද්‍ය නිලධාරි (මෙම තනතුරු පුරප්පාඩු පවතින්නේ උතුරු හා නැගෙනහිර පළාත් සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවල පමණි.) හා සත්ව පාලන නිලධාරි (මෙම තනතුරේ පුරප්පාඩු වලින් වැඩි ප්‍රමාණයක් පවතින්නේ උතුරු - නැගෙනහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පමණි) තනතුරට පත් කිරීම සඳහා අදාල සුදුසුකම් ලැබූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව, 8 1/2´´ x 12´´ ප්‍රමාණයේ A - 4 කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත් අයදුම්පත් 2008.02.29 වැනි දිනට හෝ ඊට පෙර ලේකම්, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, තැපැල් පෙට්ටිය අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 යන ලිපිනයට එවිය යුතුය.

විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසිනි.

*සටහන්* :

(i) පශු පර්යේෂණ හා පශු වෛද්‍ය නිලධාරි යන තනතුරුවලට පත් කරනු ලබන්නේ විවෘත බඳවා ගැනීම් තුළින් පමණි. සත්ත්ව පාලන නිලධාරි තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%ක් විවෘත තරග විභාගය මඟින් බඳවා ගැනීම කෙරේ. අංක 1436/8 හා 2006.03.13 දින දරන *ගැසට්* නිවේදනයෙන් සංශෝධනය කරන ලද සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථාවේ 10 (1) ඡේදයේ සඳහන් ප්‍රතිශතයන්ට සරිලන සංඛ්‍යාවක් සත්ත්ව පාලන නිලධාරි තනතුරු වලට සීමිත බඳවා ගැනීම් තුළින් පත් කර ගැනීමට නොහැකි අවස්ථාවලදී ඉතිරිවන පුරප්පාඩු සංඛ්‍යාව ද විවෘත බඳවා ගැනීම් තුළින් පුරවනු ලැබේ.

(ii) එක් අයදුම්කරුවකුට අදාළ සුදුසුකම් තිබේනම්, පශු පර්යේෂණ නිලධාරී, පශු වෛද්‍ය නිලධාරී හා සත්ව පාලන නිලධාරී යන තනතුරු අතුරෙන් ඕනෑම තනතුරු සංඛ්‍යාවක් සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

(iii) ඉල්ලුම්පත්‍රයක් හෝ සම්බන්ධ ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම දරාගත යුතු අතර, ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ පශු පර්යේෂණ නිලධාරි/පශු වෛද්‍ය නිලධාරි/සත්ව පාලන නිලධාරී තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. (තමා අයදුම්කරන තනතුර පමණක් සටහන් කළ යුතුය.)

(iv) මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි* :–

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තේරීපත් වන අයදුම්කරුවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන් විසින් අයදුම්කරනු ලබන ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ උපලේඛනගත තනතුරක් පිරවීම සඳහා පත්කරනු ලැබේ.

(iii) සෙසු සේවා නියුක්ත නියමයන් සහ සේවා කොන්දේසි 1980.10.31 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන් සහ ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා වරින්වර නිකුත් කරනු ලබන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල නියමයන් පරිදි වේ.

3. *වැටුප් ක්‍රමය* :

I. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL-1-2006 වැටුප් පරිමාණය (එනම් රු. 22,935-10 x 645-8 x 790-17 x 1,050-රු. 53,555) හිමිවන අතර, එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ 4 වන වැටුප් පියවරට එළැඹීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද 7 වන වැටුප් පියවරට එළැඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුය.

*සටහන* :

II. II වන පන්තියේ II වන ශ්‍රේණියට පත් කරනු ලබන විට නියමිත මූලික සුදුසුකම්වලට අතිරේකව ලබන පිළිගත් ශාස්ත්‍රපති/විද්‍යාපති හෝ ඊට ඉහළ පශ්චාත් උපාධියක් ලබා ඇති අය ඉහත වැටුප් ක්‍රමයේ 4 වන වැටුප් පියවරට නොවැඩි වැටුප් තලයක තබනු ඇත.

4. *බඳවා ගැනීම සඳහා පොදු සුදුසුකම්* :

(i)(*අ*) සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 20ට නොඅඩු විය යුතු අතර උපරිම වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

(*ඇ*) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අපේක්ෂකයින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අවුරුදු 40ක් වනු ඇත.

(*ඈ*) මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සනාථ විය යුතුය.

(*ඉ*) පශු වෛද්‍ය උපාධිධාරීන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(*ඊ*) සීමිත බඳවා ගැනීම් සඳහා අයදුම්කරන්නන්ට වයස් සීමාව අදාළ නොවේ.

5. *විවෘත බඳවා ගැනීම්* :

අධ්‍යාපන සුදුසුකම් :

(i) පශු පර්යේෂණ නිලධාරීන් ;
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ උපාධියක්

(ii) පශු වෛද්‍ය නිලධාරීන් ;
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධියක්

(iii) සත්ත්ව පාලන නිළධාරී තනතුර ;
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශු වෛද්‍ය විද්‍යාව/සත්ව පාලන විද්‍යාව/කෘෂිකර්මය පිළිබඳව සිව් අවුරුදු උපාධියක්

සටහන :

(i) විවෘත බඳවා ගැනීම් සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාගයට අයදුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දින හෝ ඊට පෙර මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙසට නියම කර ඇති උපාධිය සම්බන්ධයෙන් වූ පූර්ණ සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. මේ සඳහා උපාධි සහතිකයේ වලංගු වන දිනය, ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

(ii) ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර වලංගු නොවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) පශු පර්යේෂණ හා පශු වෛද්‍ය නිලධාරී යන තනතුරුවලට පත් කරනු ලබන්නේ විවෘත බඳවා ගැනීම් තුළින් පමණි. සත්ත්ව පාලන නිලධාරී තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%ක් විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම් කෙරේ. සත්ත්ව පාලන නිලධාරී තනතුරු වලට සීමිත බඳවා ගැනීම් තුළින් පත් කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිශතයට සරිලන සංඛ්‍යාවක් එසේ පත් කර ගැනීමට නොහැකි අවස්ථාවලදී ඉතිරිවන පුරප්පාඩු සංඛ්‍යාව ද විවෘත බඳවා ගැනීම් තුළින් පුරවනු ලැබේ.

(ආ) එක් අයදුම්කරුවකුට අදාළ සුදුසුකම් තිබේනම්, පශු පර්යේෂණ නිලධාරී, පශු වෛද්‍ය නිලධාරී හා සත්ව පාලන නිලධාරී යන තනතුරු අතුරෙන් ඕනෑම තනතුරු සංඛ්‍යාවක් සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්කළ හැක.

(ඇ) පොදු ප්‍රශ්න පත්‍රයට හා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට ලබාගන්නා ලද ලකුණු සංඛ්‍යාවේ එකතුවෙහි අනුපිළිවෙල හා වෙන්කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා අදාළ බඳවා ගැනීම් සිදුකරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.

07. පශු පර්යේෂණ නිලධාරී, පශු වෛද්‍ය නිලධාරී හා සත්ව පාලන නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයින් පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත තේරීම් පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. අපේක්ෂකයින් අයදුම්කරන සෑම තනතුරක් සඳහා වෙන වෙනම ඉල්ලුම්කළ යුතු අතර, විභාග ගාස්තුව වශයෙන් රු. 250ක මුදලක් පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි වන පරිදි, ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමින් මුදල් ඇණවුමක් ලබාගෙන අයදුම්පතේ අදාල ස්ථානයේ අමුණා එවිය යුතුය.

ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම්කරන සියළුම අපේක්ෂකයන් පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයක් සඳහා පෙනී සිටිය යුතුය. එහි සංයුතිය පහත පරිදි කොටස් දෙකකින් යුක්ත වේ.

(අ) පොදු ප්‍රශ්න පත්‍රය – පළමුවැනි කොටස – බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි-ලකුණු 100යි)
අපේක්ෂකයන්ගේ තාර්කික හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීම සඳහා වූ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

(ආ) පොදු ප්‍රශ්න පත්‍රය – දෙවැනි කොටස – සාමාන්‍ය දැනීම (කාලය පැය 1 1/2යි ලකුණු 100යි)
ශ්‍රී ලංකාවේ දේශපාලනික සමාජයීය සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳ මෙන්ම දේශීය හා විදේශීය වර්තමාන සිදුවීම් හා විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ව්‍යුහගත ආකාරයේ ප්‍රශ්න පත්‍රයකි.

(ඇ) ඉහත තනතුරුවලට ඉල්ලුම් කරන අපේක්ෂකයින් ඉහත සඳහන් පොදු ප්‍රශ්න පත්‍රයට අමතරව තමන් ඉල්ලුම් කරන තනතුර හෝ තනතුරු වලට අදාල ක්ෂේත්‍රයේ/ක්ෂේත්‍රයන්ගෙන් දැනුම හා හැකියාව පරීක්ෂා කිරීමේ අරමුණින් සකස් කර ඇති විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය/පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 01 1/2යි. ලකුණු 200යි.

I. පශු පර්යේෂණ නිලධාරී තනතුර සඳහා වූ විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය පහත පරිදි වේ.

01. * ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රය එහි ගති ලක්ෂණ හා විශේෂිත අංගයන් සහ එම ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා, සංවර්ධන හැකියාවන් සහ අභියෝග.

* පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම සහ අලෙවිය වෙනුවෙන් එම ක්ෂේත්‍රය තුළ රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනික ව්‍යුහයන් සංවිධානය වී ඇති ආකාරය.

02. ශ්‍රී ලංකාවේ ආර්ථික වැදගත්කමකින් යුතු සත්ත්ව රෝග, එම රෝග ජාතික ආර්ථිකයට බලපාන අයුරු සහ ඒවා මර්දනය කිරීම, ශ්‍රී ලංකාවේ පවතින සතුන්ගෙන් මිනිසුන්ට බෝවිය හැකි රෝග හා ඒවා පාලනය කිරීම.

03. මිනිස් ආහාර සඳහා යොදා ගන්නා සත්ත්ව නිෂ්පාදන නිපදවීම හා සැකසීමේදී පශු වෛද්‍යවරුන්ගේ කාර්යභාරය. එම නිෂ්පාදන පරිභෝජනය සඳහා සැලකිය යුතු ආරක්ෂිත තත්ත්වයන් එම නිෂ්පාදන හා සැකසීම් පිළිවෙත් හා අදාළ සම්මතයන් සහ ප්‍රමිතීන්.

04. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල ඇති සම්පත් ප්‍රශස්ත යොදා ගැනීම් වස් විවිධ සත්ව විශේෂයන් සඳහා යොදා ගත හැකි අභිජනන උපාය මාර්ගයන්.

05. සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන සත්ත්ව ආහාර ප්‍රභවයන්, සුලභතාවය සහ ඒවා අනාගත අවශ්‍යතාවන් සඳහා වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගයන් පශු සම්පත් සඳහා පෝෂණ අවශ්‍යතාවන් සහ එම සත්ත්ව විශේෂයන් සඳහා ආහාර සලාක සකස් කිරීම.

06. සත්ව පාලනය, කෘෂිකර්මය මත්ස්‍ය විද්‍යාව, වනජීවී, පරිසර සහ මහජන පශු වෛද්‍ය සේවාව සඳහා වැදගත් වන අණපනත්, නීති, රෙගුලාසි සහ ඒවායේ පරමාර්ථ සහ වැදගත්කම.

07. විවිධ ගොවි නිෂ්පාදන පද්ධති සහ පශු සම්පත් නිෂ්පාදනය, ගොවිපල් සැලසුම් කිරීම හා ගොවිපල් අයවැය සැකසීම, ගොවිපල් වාර්තා තබා ගැනීම සහ කෘෂි භෝග සහ පශු සම්පත් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව තුළින් ඵලදායිතාවය නැංවීම.

08. පර්යේෂණ ආකෘතීන්, ජෛවමිතියේ මූලික සිද්ධාන්තයන් සහ ඒවායේ භාවිතයන්, පර්යේෂණ ප්‍රතිඵල අර්ථ නිරූපනය සහ ඒවා ආශ්‍රිත තීරණ ගැනීම.

09. විමර්ශනය සඳහා විද්‍යාත්මක ක්‍රම භාවිතය, විද්‍යාගාර තාක්ෂණයන් හා ක්‍රමවේදයන්, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල රෝග විමර්ෂනය හා රෝග විනිශ්චය කිරීම.

10. සත්ව නිරෝධායන ක්‍රමවේදයන්, ආනයන හා අපනයන කාර්යයන් කෙරෙහි සතුන් හා සත්ව නිෂ්පාදන සම්බන්ධව සත්ව නිරෝධායන පිළිවෙත්හි ඇති වැදගත්කම.

II. පශු වෛද්‍ය නිළධාරි තනතුර සඳහා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය පහත දැක්වේ.

01. * ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රය එහි ගති ලක්ෂණ හා විශේෂිත අංගයන් සහ එම ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා, සංවර්ධන හැකියාවන් සහ අභියෝග,

* පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම සහ අලෙවිය වෙනුවෙන් එම ක්ෂේත්‍රය තුළ රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනික ව්‍යූහයන් සංවිධානය වී ඇති ආකාරය.

02. ශ්‍රී ලංකාවේ ආර්ථික වැදගත්කමකින් යුතු සත්ත්ව රෝග, එම රෝග ජාතික ආර්ථිකයට බලපාන අයුරු සහ ඒවා මර්දනය කිරීම, ශ්‍රී ලංකාවේ පවතින සතුන්ගෙන් මිනිසුන්ට බෝවිය හැකි රෝග හා ඒවා පාලනය කිරීම.

03. මිනිස් ආහාර සඳහා යොදා ගන්නා සත්ව නිෂ්පාදන නිපදවීම හා සැකසීමේ දී පශු වෛද්‍යවරුන්ගේ කාර්යභාරය, එම නිෂ්පාදන පරිභෝජනය සඳහා සැලකිය යුතු ආරක්ෂිත තත්ත්වයන් එම නිෂ්පාදන හා සැකසීම් පිළිවෙත් හා අදාළ සම්මතයන් සහ ප්‍රමිතීන්.

04. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල ඇති සම්පත් ප්‍රශස්ත යොදා ගැනීම් වස් විවිධ සත්ව විශේෂයන් සඳහා යොදා ගත හැකි අභිජනන උපාය මාර්ගයන්.

05. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන සත්ව ආහාර ප්‍රභවයන්, සුලභතාවය සහ ඒවා අනාගත අවශ්‍යතාවයන් සඳහා වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගයන් පශු සම්පත් සඳහා පෝෂණ අවශ්‍යතාවයන් සහ එම සත්ව විශේෂයන් සඳහා ආහාර සලාක සකස් කිරීම.

06. සත්ව පාලනය, කෘෂිකර්මය, මත්ස්‍ය විද්‍යාව, වනජීවී පරිසරය සහ මහජන පශු වෛද්‍ය සේවාව සඳහා වැදගත් වන අණපනත්, නීති, රෙගුලාසි සහ ඒවායේ පරමාර්ථ සහ වැදගත්කම.

07. විවිධ ගොවි නිෂ්පාදන පද්ධති සහ පශු සම්පත් නිෂ්පාදනය, ගොවිපල් සැලසුම් කිරීම හා ගොවිපල් අයවැය සැකසීම, ගොවිපල් වාර්තා තබා ගැනීම සහ කෘෂි භෝග සහ පශු සම්පත් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතා තුළින් ඵලදායීතාවය නැංවීම.

08. විමර්ශනය සඳහා විද්‍යාත්මක ක්‍රම භාවිතය, විද්‍යාගාර තාක්ෂණයන් හා ක්‍රමවේදයන්, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ රෝග විමර්ෂණය හා රෝග විනිශ්චය කිරීම.

09. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා තාක්ෂණ දැනුම ලබා දීම සඳහා කෘෂි/සත්ත්ව පාලන ව්‍යාප්ත සේවාවල ඇති වැදගත්කම. එම කාර්යයන් සඳහා උචිත ව්‍යාප්ති සේවා උපාය මාර්ග සහ ක්‍රමවේදයන්.

10. ගෝලීයකරණය, තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රයට එහි ඇති බලපෑම.

11. පශු සම්පත් ක්ෂේත්‍රය කෙරෙහි ජාත්‍යන්තර වෙළඳාම, වෙළඳ ගනුදෙනු සහ ඒවායේ වැදගත්කම සහ බලපෑම.

12. සත්ත්ව නිරෝධායන ක්‍රමවේදයන්, ආනයන හා අපනයන කාර්යයන් කෙරෙහි සතුන් හා සත්ත්ව නිෂ්පාදන සම්බන්ධව සත්ත්ව නිරෝධායන පිළිවෙත්හි ඇති වැදගත්කම.

III. සත්ත්ව පාලන නිළධාරී තනතුර සඳහා වූ විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය පහත පරිදි වේ.

01. * ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රය එහි ගති ලක්ෂණ හා විශේෂිත අංගයන් සහ එම ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා, සංවර්ධන හැකියාවන් සහ අභියෝග.

* පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම සහ අලෙවිය වෙනුවෙන් එම ක්ෂේත්‍රය තුළ රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනික ව්‍යූහයන් සංවිධානය වී ඇති ආකාරය.

02. ග්‍රාමීය සහ ජාතික ආර්ථික සංවර්ධනය කෙරෙහි පශු සම්පත් ක්ෂේත්‍රයේ වැදගත්කම සහ එහි ඇති සබැඳියාව.

03. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල ඇති සම්පත් ප්‍රශස්ත ලෙස යොදා ගැනීම් වස් විවිධ සත්ත්ව විශේෂයන් සඳහා යොදාගත හැකි අභිජනන උපාය මාර්ගයන්.

04. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන සත්ත්ව ආහාර ප්‍රභවයන්, සුලභතාවය සහ ඒවා අනාගත වශ්‍යතාවන් සඳහා වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගයන්.
පශු සම්පත් සඳහා පෝෂණ අවශ්‍යතාවන් සහ එම සත්ව විශේෂයන් සඳහා ආහාර සලාක සකස් කිරීම.

05. සත්ත්ව පාලනය, කෘෂිකර්මය, මත්ස්‍ය විද්‍යාව, වනජීවී පරිසරය සහ මහජන පශු වෛද්‍ය සේවාව සඳහා වැදගත් වන අණපනත්, නීති, රෙගුලාසි සහ ඒවායේ පරමාර්ථ සහ වැදගත්කම.

06. විවිධ ගොවි නිෂ්පාදන පද්ධති සහ පශු සම්පත් නිෂ්පාදනය, ගොවිපල් සැලසුම් කිරීම හා ගොවිපල් අයවැය සැකසීම, ගොවිපල් වාර්තා තබා ගැනීම සහ කෘෂි භෝග සහ පශු සම්පත් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතා තුළින් ඵලදායීතාව නැංවීම.

07. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා තාක්ෂණ දැනුම ලබා දීම සඳහා කෘෂි/සත්ත්ව පාලන ව්‍යාප්ත සේවාවල ඇති වැදගත්කම. එම කාර්යයන් සඳහා උචිත ව්‍යාප්ති සේවා උපාය මාර්ග සහ ක්‍රමවේදයන්.

08. ගෝලීයකරණය, තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රයට එහි ඇති බලපෑම.

09. පශු සම්පත් ක්ෂේත්‍රය කෙරෙහි ජාත්‍යන්තර වෙළඳාම, වෙළඳ ගනුදෙනු සහ ඒවායේ වැදගත්කම සහ බලපෑම.

10. සත්ව නිරෝධායන ක්‍රමවේදනයන්, ආනයන හා අපනයන කාර්යයන් කෙරෙහි සතුන් හා සත්ව නිෂ්පාදන සම්බන්ධව සත්ව නිරෝධායන පිළිවෙත්හි ඇති වැදගත්කම.

08. *සීමිත බඳවා ගැනීම* :

I. සත්ව පාලන නිළධාරී තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%ක් සීමිත බඳවා ගැනීම් වලින් පුරවනු ලැබේ.

II. සීමිත බඳවා ගැනීම සඳහා සුදුසුකම් :
සත්ත්ව පාලනය/කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමාවක් සහිත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නියුතු පශු සම්පත් සංවර්ධන නිළධාරියෙකු/පර්යේෂණ සහකාර වරයෙකු හෝ පළාත් සභා සේවයේ නියුතු සත්ව සංවර්ධන උපදේශකවරයෙකු වීම හෝ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන

නිලධාරි සේවයේ හෝ පළාත් සභා සේවයේ හෝ නියුතු සත්ත්ව සංවර්ධන උපදේශක වරයෙකු වශයෙන් හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ හෝ 1 වැනි පන්තියේ වසර 04ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම

*හෝ*

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සත්ත්ව පාලන විද්‍යා හෝ කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් සහිත වසර 05ක සේවා කාලයක් ඇති සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු සම්පත් සංවර්ධන නිලධාරී/පර්යේෂණ සහකාර/පළාත් සභා සේවයේ නියුතු සත්ව සංවර්ධන උපදේශකවරයෙකු වීම.

III. බඳවා ගැනීමේ ක්‍රමය :

(*අ*) ඉහත 7හි සඳහන් පොදු ප්‍රශ්න පත්‍රයට හා සත්ව පාලන නිලධාරීන් සඳහා වූ විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට අයදුම්කරුවන් පිළිතුරු සැපයිය යුතුය.

(*ආ*) පොදු ප්‍රශ්න පත්‍රයට හා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට ලබා ගන්නා ලද ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල හා වෙන්කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා අදාළ බඳවා ගැනීම් සිදුකරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.

*සටහන* :

ඉහත සුදුසුකම් සපුරාලන පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු නිලධාරීන්ට ද මේ සඳහා අයදුම් කළ හැක.

9. සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම්දුන් විට පහත සඳහන් ලියැවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. උපාධිය හා / හෝ උසස්ම අධ්‍යාපන සහතිකය
iii. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් මින් එකක් පාඨමාලා පිළිබඳ අධ්‍යක්ෂගෙන්, විශ්ව විද්‍යාලීය මහාචාර්ය වරයාගෙන්, හෝ ආචාර්ය වරයාගෙන් විය යුතුය. (දැනටමත් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින්නන් සඳහා මෙම සහතිකය ලබාගැනීම අවශ්‍ය නොවේ.)
iv. සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතිකය
v. පශු වෛද්‍ය වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සහතිකය (පශු පර්යේෂණ නිලධාරී, හා පශු වෛද්‍ය නිලධාරී තනතුරු වලට අයදුම්කරන්නන් සඳහා පමණක් මෙම අවශ්‍යතාවය අදාළ වේ.)

10.i. මෙම *ගැසට් නිවේදනයේ* විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍යසේවා කොමිෂන් සභාව සතුවනු ඇත.
ii. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍යසේවා කොමිෂන් සභාව සතුවේ.
iii. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨය අතර යම් අනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.
iv. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.
v. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණු සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම්, යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ඇය සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

සුනිමල් සේනාරත්න,
ලේකම්,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

වැනි දින,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
එල්. එල්. අංක 56 ඒ,
අංක 45, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

ආදර්ශ අයදුම් පත්‍රය

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ
II වන පන්තියේ II වන ශ්‍රේණියේ
…………………………………………
**තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය සඳහා අයදුම්පත**

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා ඔබ පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය :
අදාළ කොටුවේ x ලකුණ යොදන්න.

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

1. (i) මුලකුරු සමග නම :——————.
සිංහලෙන් :——————————.
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. ජාතික හැඳුනුම්පත් අංකය :

3. තැපැල් ලිපිනය :——————.
(ලිපිනයෙහි යම් වෙනසක් සිදුවුවහොත්, වහාම ඒ බව දැනුම් දිය යුතුය.)

4. ස්ථිර පදිංචි ස්ථානය අයත් :
(i) පළාත් සභාව :——————.
(ii) දිස්ත්‍රික්කය :——————.

5. උපන් දිනය :——————.

වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :——————.
අවුරුදු :——————. මාස:——————. දින:——————.

6. *ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන බව* :——————.
ජාතිය (සිංහල/ශ්‍රී ලංකා ද්‍රවිඩ/ඉන්දියානු ද්‍රවිඩ/මුස්ලිම්/වෙනත්) :—.

7. (*අ*) *ස්ත්‍රී/පුරුෂ භාවය* :——————.
(*ආ*) විවාහක/අවිවාහක ද? වැන්දඹු ද යන වග :—————.

8. *අධ්‍යාපන සුදුසුකම්* :

| *සමත් වූ උපාධිය/ පශ්චාත් උපාධි සුදුසුකම* | *පන්තිය* | *විශ්ව විද්‍යාලය* | *වර්ෂය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

09. ශ්‍රී ලංකා පශු වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි අංකය හා දිනය :——————.

10. නිවේදනයේ 6-II ඡේදය යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් විසින් පමණක් සම්පූර්ණ කිරීම සඳහා පමණි.

සත්ත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමාවට අදාළ විස්තර :——————.

11. *සේවා විස්තර* :

| *දැනට දරන තනතුර* | *සේවා කාලය* | | *සේවා ස්ථානය* | *දිස්ත්‍රික්කය/පළාත් සභාව* |
|---|---|---|---|---|
| | *සිට* | *දක්වා* | | |
| 1.<br>2.<br>3.<br>4. | | | | |

12. ඔබ තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ඔබේ මනාප අනුපිළිවෙල දක්වන්න.

(i) —————.
(ii) —————.
(iii) —————.

13. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වැරදිකරුවකු වී නොමැති බව ද මින් සහතික කරමි.

*සටහන* :

පහත විස්තර සඳහන් මුදල් ඇණවුම මෙම අයදුම්පත්‍රයට අමුණා ඇත :
මුදල් ඇණවුම් අංකය :——————.
දිනය :——————.
තැපැල් කාර්යාලය :——————.

දිනය :——————.

——————,
අයදුම්කරුගේ අත්සන.

i. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

ඉහත අයදුම්කරු වූ ......................... මහතා/මිය./මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ............................ පළාත් සභාවේ ................................ තනතුරක් දරන නිලධාරිවරයෙකු බවත්, ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොණුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ඇය මෙම පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වමි. (අදාළ නොවන වචන කපා හරින්න).

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා/
පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව).

දිනය :——————.

02-54

---

## රියැදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2008

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රියැදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2008.03.05 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය අප්‍රේල් මස කොළඹ දී පවත්වනු ලැබේ.

*සුදුසුකම්* :

1. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය ;
(ii) වයස අවුරුදු 25ට නොඅඩු විය යුතුය ;
(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී අංක ගණිතය හෝ ගණිතය හා භාෂාව ඇතුලුව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතුය ;
(iv) උපදේශකයෙකු වීමට තමා ඉල්ලුම් කරනු ලබන්නේ යම් පන්තියකට අයත් වාහන සම්බන්ධයන් ද? එම පන්තියේ වාහන ධාවනය කිරීම සඳහා එම ඉල්ලුම් පත්‍රයේ දිනට යටත් පිරිසයෙන් අවුරුදු 05කට පෙර ලබා ගත් රියැදුරු බලපත්‍රයක් ඔහුට/ඇයට තිබිය යුතුය.

02. *විභාග ක්‍රමය* :

01. මෙම විභාගය සිංහල/දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(අපේක්ෂකයන් මෙම සුදුසුකම් ලබන භාෂා මාධ්‍යයෙන්)

02. සියලුම ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතුය. මුලදී ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

03. *විභාගයට අදාළ විෂයයන්* :

මෙම විභාගය මෝටර් රථ ප්‍රවාහන කළමණාකරණය පිළිබඳ කොටස් 02කින් යුතු ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය :

(i) මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය I - කාලය පැය 1යි. බහුවරණ ප්‍රශ්න 50යි.

(ii) මෝටර් රථ ප්‍රවාහන කළමණාකරණය II - කාලය පැය 2යි විනාඩි 30 යි.
(මෙය ප්‍රශ්න 8කින් සමන්විත වන අතර ව්‍යුහගත අර්ධ රචනා ශෛලිය ප්‍රශ්න පත්‍රයකි. සෑම අයදුම්කරුවෙක්ම පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය.

04. *විෂය නිර්දේශය* :

මෙම ප්‍රශ්න පත්‍ර 2කට මාර්ග නීති රීති, මෝටර් රථ කාර්මික දැනුම, රිය පැදවීමේ හැකියාවන් පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ.

පහත විෂයයන් ආවරණය වන පරිදි ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ :

1. රියැදුරු උපදේශකවරයෙකු හොඳ රියැදුරෙකු විය යුතු බැවින් රියැදුරෙකු සතු ගුණාංග ;
2. රියැදුරු උපදේශකවරයෙකු ගුරුවරයෙකු බැවින් ඔහුගේ වගකීම ආකල්ප හා කුසලතා ;
3. මෝටර් වාහන පනතේ රියැදුරු පාසල් හා රියැදුරු උපදේශකවරුන් සම්බන්ධව ඇති ප්‍රතිපාදන ;
4. මෝටර් වාහන පනතේ තැනීම්, රෙගුලාසි පිළිබඳ දැනීම ;
5. මහා මාර්ගෝපදේශ සංග්‍රහය හා එම *ගැසට්* නිවේදන පිළිබඳ දැනීම ;
6. මෝටර් වාහන පනතේ තැනීම්, රෙගුලාසි රියැදුරු උපදේශකවරුන් හා රියදුරු පාසල්වලට අදාල රෙගුලාසි ;
7. රියැදුරු පුහුණු අත් පොත හා රියැදුරු උපදේශක අත් පොත එහි විෂය නිර්දේශයන් ;
8. වාහන නඩත්තු කිරීම සම්බන්ධයෙන් ඇති දැනුම්, වාහන ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනීම වාහනයේ ප්‍රධාන පද්ධතීන් සම්බන්ධ යාන්ත්‍රික දැනුම :

* එන්ජිම ගියර් පෙට්ටිය සම්බන්ධ දැනුම ;
* සුක්කානම් පද්ධතිය එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනීම ;
* අවලම්බන පද්ධතිය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ සාමාන්‍ය දැනීම ;
* තිරිංග පද්ධතිය එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනීම ;
* විදුලි පද්ධතිය එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනීම.

05. *තේරීමේ පටිපාටිය* :

ලිඛිත විභාගයෙන් 40%ක් හෝ එයට වඩා ලකුණු ලබාගත් අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂණය කරනු ලැබේ. පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. *අයදුම්කරන පිළිවෙල* :
ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයින් තම අත් අකුරෙන් පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අපේක්ෂකයාට ප්‍රයෝජනවත් වනු ඇත.

02. ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයාට විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙලකර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළවලට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

03. විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2008.01.29 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පිණිස බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව "රියැදුරු උපදේශකයන් බඳවා ගැනීමේ වන ලිඛිත විභාගය" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව එවන ලද කිසිදු ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ.

04. *විභාග ගාස්තු* .– විභාග ගාස්තුව රු. 720ක් වේ. මෙම මුදල මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක 2003.20.14 ශීර්ෂයට බැර වෙන සේ දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. ලදු පතේ ඡායා පිටපතක් ඉල්ලුම්කරු ළඟ තබා ගත යුතුය. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න අයදුම්කරු විමසා බැලිය යුතු අතර, අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

05. ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,37,060 කට වැඩි මූලික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06. සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපැල් කිරීමේදී ඉල්ලුම් පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

07. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් ඉල්ලුම් පත්‍රය හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලුම් ලිපිය ද ළඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

07. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාව* :
තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පිළිගනු ඇත :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

09. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් මගින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

බී. විජයරත්න,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්.

2008 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ 05,
ඇල්විටිගල මාවත,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දී ය.

රියැදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන
ලිඛිත විභාගය - 2008

| | | |
|---|---|---|
| | | |

01. මුලකුරු සමඟ අගට යෙදෙන නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

05. උපන් දිනය :
අවුරුද්ද : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

06. අයදුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනට වයස :——————.
අවුරුදු : [ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

07. *ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය* : (සිංහල 2 /දෙමළ3/ ඉංග්‍රීසි 4) : [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

08. *අධ්‍යාපන සුදුසුකම්* :——————.

09. වෘත්තීය සුදුසුකම් :——————.

10. විභාග ගාස්තු ගෙවා ලබා ගත් ලදුපතේ අංකය, නිකුත් කළ කාර්යාලය හා දිනය :————.
(ලදු පතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

11. උපදේශකයෙකු වීමට ඉල්ලුම් කරන වාහන පන්තිය :————.

12. තමා ලබා ගෙන ඇති :

(i) රියැදුරු බලපත් අංකය :——————.
(ii) නිකුත් කළ දිනය :——————.
(iii) කුමන වාහන පන්තියක් පැදවීමට ද යන වග :——————.

ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර, මා විසින් කරන ලද ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් රියැදුරු උපදේශකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට නුසුදුස්සෙකු වන බව ලියාපදිංචි කිරීමෙන් පසු එය අවලංගු කිරීමට යටත් වන බව ද මම දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කර සිටිමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

02-118

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

## 1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.
5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අගලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අගලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අගලේ සෑම කොටසකටම සම්පූර්ණ අගලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව * :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | පිටරට |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ඡේදය | 520 0 | 1,007 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වන ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව | තැපැල් (මෙරටː |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| (අ) | I වන කොටස | 31 0 | 5 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් ක | 11 0 | 5 0 |
| (ආ) | I වන ඡේදය | 10 0 | 5 0 |
| | II වන ඡේදය | 12 0 | 5 0 |
| | III වන ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| පෙබරවාරි | 2008.02.01 | සිකුරාදා | 2008.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.08 | සිකුරාදා | 2008.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.15 | සිකුරාදා | 2008.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.22 | සිකුරාදා | 2008.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.29 | සිකුරාදා | 2008.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2008.03.07 | සිකුරාදා | 2008.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.14 | සිකුරාදා | 2008.02.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.19 | බදාදා | 2008.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.28 | සිකුරාදා | 2008.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2008.04.04 | සිකුරාදා | 2008.03.19 | බදාදා | දහවල් | 12.00 |
| | 2008.04.11 | සිකුරාදා | 2008.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.04.18 | සිකුරාදා | 2008.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.04.25 | සිකුරාදා | 2008.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.